සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

| 32 | S | I |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

First Term Test - Grade 13 - 2020

විභාග අංකය .............................

# ව්‍යාපාර අධ්‍යයනය I

කාලය පැය දෙකයි

උපදෙස්
- ♦ විභාග අංකය ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සඳහන් කරන්න.
- ♦ සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ♦ ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ♦ ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.
- ♦ සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

01. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ව්‍යාපාර සම්බන්ධයෙන් **සත්‍ය** වන්නේ,
1. ව්‍යාපාර වශයෙන් සලකන්නේ ලාභ අරමුණු කරගත් සංවිධාන පමණි.
2. ගනුදෙනු අඛණ්ඩව සිදුවීම ව්‍යාපාරයක ගති ලක්ෂණයක් නොවේ.
3. ව්‍යාපාර විසින් මිනිස් අවශ්‍යතා නිර්මාණය කරනු ලැබේ.
4. සම්පත් වලට අගය එකතු කිරීම ව්‍යාපාරයක ප්‍රධාන කටයුත්තකි.
5. ව්‍යාපාරයකට නවෝත්පාදනය හරහා ආර්ථිකයක පැවැත්මට දායක විය නොහැක (.....)

02. මුදලේ විකාශනය සම්බන්ධයෙන් **සත්‍ය** ප්‍රකාශය තෝරන්න,
1. බැංකු මුදල් භාවිතය විද්‍යුත් මුදල් භාවිතයට පසු ඇතිවූ සංකල්පයකි.
2. කාසි හා නෝට්ටු භාවිතයෙන් පසු බැංකු මුදල් භාවිතය ඇරඹිනි.
3. කාසි හා නෝට්ටු භාවිතයෙන් පසු මුදලේ විකාශනයේ ඊළඟ අදියර විද්‍යුත් මුදල් භාවිතයයි.
4. කාසි හා නෝට්ටු භාවිතයෙන් පසු ලෝහ කාසි මුදල් භාවිතය මුදලේ විකාශනයේ ඊළඟ අදියරයයි.
5. ලෝහ වර්ග භාවිතයෙන් පසු ද්‍රව්‍ය මුදල් භාවිතය ඇති විය.

(.....)

03. කර්මාන්ත මූලය අනුව ද.දේ.නි. සම්බන්ධයෙන් **නිවැරදි** ප්‍රකාශය වනුයේ,
1. පතල් හා කැණීම් කෘෂි කාර්මික අංශයට අයත් වේ.
2. විදුලිය ගෑස් වාෂ්ප හා වායුසමීකරණ සැපයීම සේවා අංශයට අයත් වේ.
3. ඉදිකිරීම් කර්මාන්තය හා එම සේවාවන් සේවා අංශයට අයත් වේ.
4. වන වගාව ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන කාර්මික අංශයට අයත්වේ.
5. පතල් හා කැණීම් කාර්මික අංශයට අයත් වේ. (.....)

04. ව්‍යාපාරයක් සමාජ වගකීම් ඉටුකළ යුතු පාර්ශව සහ ඊට අදාල කාර්යයන් පිළිවෙළින් X හා Y ලෙස වගුවේ දැක්වේ.

| X | Y |
|---|---|
| A සමාජය | 1. සමානාත්මතාව |
| B ගනුදෙනුකරු | 2. සාධාරණ ඉපයීම |
| C අයිතිකරුවන් | 3. අපද්‍රව්‍ය කළමණාකරණය |
| D සේවකයින් | 4. සාධාරණ මිල |

X හා Y නිවැරදිව ගැලපූ විට **නිවැරදි** යුගල කාණ්ඩය කුමක්ද?

1. A – 1, B - 2, C - 3, D - 4
2. A – 4 B – 3, C – 2, D -1
3. A – 2, B – 3, C -1, D - 4
4. A – 3, B – 4, C - 4, D - 1
5. A – 1, B – 2, C - 4, D - 3 (.....)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

05. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණක් **නොවන්නේ,**
1. ප්‍රමිති සහතික සලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
2. ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලන කටයුතු සඳහා පර්යේෂණ පහසුකම් සැපයීම.
3. දේශීය හා විදේශීය නිෂ්පාදිත භාණ්ඩ ප්‍රමිතිවලට අනුකූලදැයි පරීක්ෂා කිරීම.
4. පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම.
5. අධ්‍යාපනය උපදේශනය වෙනත් මාර්ගවලින් ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලන කටයුතු දිරිගැන්වීම. (.....)

06. පහත දැක්වෙන රජයේ අරමුණු හා ව්‍යාපාරයක අරමුණු කිහිපයකි.

A - පූර්ණ සේවා නියුක්තිය.
B - වෙළඳපොල පුළුල් කිරීම.
C - මිල ස්ථායිතාව.
D - වෙළෙඳපොළේ රැඳී සිටීම.
E - පෞද්ගලික තෘප්තිය.
F - ලාභ උපරිම කිරීම.

රජයේ අරමුණු හා ව්‍යාපරයක අරමුණු පිළිවෙලින් පෙළගැස්වූ විට පිළිතුර වන්නේ
1. AC හා BDEF 2. ADE හා CBF 3.DEF හා ABC
4. DFA හා CBE 5. ACB හා DEF (.....)

07. කේවල ස්වාමි ව්‍යාපාරයක පමණක් දැකිය හැකි වාසි ඇතුලත් කාණ්ඩය තෝරන්න
1. පහසුවෙන් ආරම්භ කළ හැකිවීම/ වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකිවීම/ පහසුවෙන් විසුරුවා හැරිය හැකිවීම/ සාමූහික වගකීම.
2. ස්වාධීන තීරණ ගත හැකිවීම/ පහසුවෙන් ආරම්භ කළ හැකි වීම/ පාලනය පහසුවීම/ ව්‍යාපාරික තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා වීම.
3. පහසුවෙන් ආරම්භ කළ හැකිවීම/ ස්වාධීන තීරණගත හැකිවීම/ සාමූහික වගකීම/ වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකිවීම.
4. පාලනය පහසුවීම/ වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකිවීම/ පහසුවෙන් විසුරුවාහැරිය හැකි වීම/සාමූහික වගකීම.
5. පහසුවෙන් ආරම්භ කළ හැකිවීම/ පහසුවෙන් විසුරුවා හැරිය හැකි වීම/ සාමූහික වගකීම/ පාලනය පහසුවීම. (.....)

08. සීමා සහිත සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියේ ඇතුලත් කරුණක් **නොවන්නේ,**
1. සමාගමේ පරමාර්ථ
2. සමාගමේ කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්
3. සමාගමේ කළමණාකරණය
4. අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත
5. සමාගම් පරිපාලනය (.....)

09. වරලත්හිමියා විසින් වරලත්ලාභියාට සපයන පහසුකමක් **නොවන්නේ**
1. කළමණාකරණ පුහුනුව ලබාදීම.
2. අලෙවිකරණ සහාය ලබාදීම.
3. ප්‍රාග්ධනය ආයෝජනය කිරීම.
4. වෙළඳසැලේ නිමාව සකස් කරදීම.
5. වෙළඳ නාමය භාවිතයට අවසර දීම. (.....)

10. ව්‍යවසායකත්ව ගති ලක්ෂණ ඇතුලත් පිළිතුර තෝරන්න.
1. අවදානම් දැරීමට ඇති කැමැත්ත/ කැපවීම/ නිර්මාණශීලී බව/ අන්තර්පුද්ගල හැකියා/ නායකත්ව කුසලතා
2. අවදානම් දැරීමට ඇති කැමැත්ත/ නිර්මාණශීලී බව/ කැපවීම/ ආත්ම විශ්වාසය/ ස්වාධීන බව
3. නිර්මාණශීලී බව/ කැපවීම/ අන්තර් පුද්ගල හැකියා/ ආත්ම විශ්වාසය/ ස්වාධීනබව
4. නිර්මාණශීලී බව/ අන්තර්පුද්ගල හැකියා/ නායකත්ව කුසලතා/ කැපවීම/ ආත්ම විශ්වාසය
5. අවදානම් දැරීමට ඇති කැමැත්ත/ නිර්මාණශීලී බව/ නායකත්ව කුසලතා/ අන්තර්පුද්ගල හැකියා/ මූලික කළමණාකරණ කුසලතා (.....)

11. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් දිරිගැන්වීමේ ක්‍රමයක් වශයෙන් විශිෂ්ටතා සම්මාන ලබාදීම සිදුකරන ආයතනය වන්නේ,
1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය.
2. කාර්මික තාක්ෂණ ආයතනය.
3. කාර්මික සංවර්ධන මණ්ඩලය.
4. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව මණ්ඩලය.
5. ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය. (.....)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

12. පහත සඳහන් මුදල් වර්ග අතුරෙන් ආසන්න මුදල් වර්ගයට අයත් වන්නේ,
1. වාණිජ බැංකුවල ඇති ජංගම ගිණුම් තැන්පතු.
2. කාසි හා නෝට්ටු.
3. භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා.
4. හරපත්, ණයපත්.
5. පෙරගෙවුම් කාඩ්පත්. (.....)

13. චෙක්පත් සම්බන්ධයෙන් **නිවැරදි** වාක්‍ය ඛණ්ඩලය තෝරන්න,
1. චෙක්පතක අණකරු සැම විටම බැංකුවකි.
2. "ගනුදෙනු කළ නොහැක" යනුවෙන් රේඛිත චෙක්පතක් පැවරිය නොහැකිය.
3. සාමාන්‍ය රේඛිත චෙක්පතකට කවුන්ටරයෙන් මුදල් ලබාගත හැකිය.
4. ධාරක චෙක්පතක් පැවරීමේදී පිටසන අවශ්‍ය නොවේ.
5. චෙක්පතක් රේඛණය කල හැක්කේ අණකරුට පමණි. (.....)

14. විශේෂිත මූල්‍ය ආයතනවලට අයත් මූල්‍ය ආයතන කාණ්ඩය වන්නේ,
1. බලපත්‍රලාභි වාණිජ බැංකු/ කොටස් සමාගම්/ ප්‍රාථමික අලෙවිකරුවන්/ ඒකක භාර/ වෙළඳපොල අතරමැදියන්
2. බලපත්‍රලාභී විශේෂිත බැංකු/ බලපත්‍රලාභි මුදල් සමාගම්/ ප්‍රාථමික අලෙවිකරුවන්/ කොටස් තැරැව්කරුවන්/ වෙළඳපළ අතරමැදියන්
3. ප්‍රාථමික අලෙවිකරුවන්/ කොටස් තැරැව්කරුවන්/ ඒකක භාර/ වෙළඳපොළ අතරමැදියන්/ ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
4. බලපත්‍රලාභි වානිජ බැංකු/ බලපත්‍රලාභි මුදල් සමාගම්/ රක්ෂණ සමාගම්/ ප්‍රාථමික අලෙවිකරුවන්/ වෙළඳපොල අතරමැදියන්
5. බලපත්‍රලාභී විශේෂිත බැංකු/ කොටස් තැරැව්කරුවන්/ ඒකක භාර/ ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්/ බලපත්‍රලාභී මුදල් සමාගම් (.....)

15. ණයපත් මගින් ගනුදෙනු කිරීමේදී ගනුදෙනුකරුවන්ට අත්වන වාසියක් වන්නේ,
1. ණයට විකුණුම් සඳහා මුදල් ලැබීම ස්ථිර වීම.
2. යම්කාල සීමාවක් සඳහා පොලී රහිත ණයක් වීම.
3. පිරිවැටුම වැඩිවීම නිසා ලාභය වැඩිවීම.
4. විශේෂිත යන්ත්‍රයක් ස්ථාපිත කිරීමට සිදුවීම.
5. නොමිලේ ප්‍රමාණයක් ලැබීම. (.....)

16. ලිඛිත සන්නිවේදන මාධ්‍යයේ වාසියක් වන්නේ,
1. තොරතුරු කෙටියෙන් පැහැදිලිව ඉදිරිපත් කළ හැකිවීම.
2. තොරතුරුවල නිරවද්‍යතාව ඉහළ මට්ටමක පැවතීම.
3. වඩාත් විස්තරාත්මකව තොරතුරු ඉදිරිපත් කළ හැකිවීම.
4. තොරතුරු පහසුවෙන් අවබෝධ කරගත හැකිවීම.
5. තොරතුරු ඉතා ඉක්මනින් රහසිගතව ඉදිරිපත් කළ හැකිවීම. (.....)

17. ප්‍රවාහනය විවිධ පාර්ශවවලට වැදගත්වන ආකාර කිහිපයක් පහත දැක්වේ.

A - අමුද්‍රව්‍ය කළට වේලාවට ගෙන්වා ගැනීමට
B - ජාත්‍යන්තර සබඳතා වර්ධනය කිරීම
C - සේවකයින් වේලාවට ගෙන්වා ගැනීම
D - වෙළඳපොල ව්‍යාප්තියට
E - රැකීරක්ෂා හා සංචරණය සඳහා
F - ව්‍යාපාරික සබඳතා පැවැත්වීමට

ඉහත සඳහන් දෑ අතුරින් ප්‍රවාහනය ව්‍යාපරිකයාට වැදගත් වන ආකාරය ඇතුලත් පිළිතුර වන්නේ,

1. A, B, C, D
2. A, C, D, E
3. A, B, E, F
4. A, C, D, F
5. A,, D, E, F (.....)

18. වෙළඳ අතරමැදියෙකු ලෙස සැලකිය නොහැක්කේ
1. තොග වෙළෙන්දා
2. සිල්ලර වෙළෙන්දා
3 පාරිභෝගිකයා
4. කොමිස් නියෝජිතයා
5. සාධ්‍යකයා (.....)

NWP EXAM

19. විදේශ වෙළඳාමේදී භාවිතා වන ලියකියවිලි කිහිපයක් X තීරුවේද ඒවායේ අවශ්‍යතාවය Y තීරුවේද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ආනයන සටහන්කරය | A - අපනයනකරුවන්ගේ භාණ්ඩ ඇණවුම් කිරීමට අපනයනකරුට අවශ්‍යවේ |
| 2. වේදිකා කුවිතාන්සිය | B - ද්‍රව්‍ය නෞභාරපත්‍රයක් වෙනුවට පාරිශුද්ධ නෞභාරපතක් ලබා ගැනීමට අපනයන කරුට අවශ්‍ය වේ. |
| 3. හානි රක්ෂණ ලිපිය | C - ආනයනකරු වෙනුවෙන් වරායට ලැබී ඇති භාණ්ඩ පිළිබඳ අයිතිය ප්‍රකාශ කිරීමට ආනයනකරුට අවශ්‍ය වේ |
| 4. ඉන්ඩෙන්ටුව | D - රේගුවට භාණ්ඩ භාරදුන් බව තහවුරු කිරීමට අපනයන කරුට අවශ්‍ය වේ. |

X තීරුවේ දැක්වෙන ලියවිලි හා Y තීරුවේ දැක්වෙන අවශ්‍යතා නිවැරදිව අනුපිළිවෙලින් ගළපා ඇති පිළිතුර තෝරන්න.

1. B, C, D, A 2. C, D, A, B 3. C, D, B, A
4. D, A, B, C 5. D, B, C, A (.....)

20. ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීමේදී හෝ විකිණීමේදී එම ගනුදෙනු තම පෞද්ගලික නමින්ම සිදු කරනු ලබන නියෝජිතයා වන්නේ,

1. කොමිස් නියෝජිතයා 2. තැරැව්කරුය 3. වෙන්දේසිකරුය
4. කැපකරු නියෝජිතයාය. 5. සාධ්‍යකයාය (.....)

21. ව්‍යාපාර සංවිධානයක සම්පත් නාස්තියකින් තොරව හා අවම පිරිවැයකින් භාවිතා කිරීම හඳුන්වන්නේ,

1. ඵලදායකත්වය නමිනි 2. කාර්‍යක්ෂමතාවය නමිනි 3. සඵලදායීතාවය ලෙසිනි
4. කාර්‍ය සාධනය ලෙසිනි 5. තිරසර සංවර්ධනය ලෙසිනි (.....)

22. පහත වගුවේ X තීරුවේ කළමණාකරන කාර්‍යයන්ද Y තීරුවේ ඒ හා සම්බන්ධ කටයුතුද දැක්වේ

| X | Y |
|---|---|
| A සැලසුම්කරණය | 1. විචල්‍යයන් හඳුනා ගැනීම |
| B සංවිධානකරණය | 2. බලතල පැවරීම |
| C මෙහෙයවීම | 3. නායකත්වය |
| D පාලනය | 4. උපාය මාර්ග සැකසීම |

X හා Y නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

1. A-4, B-2, C-3, D-1 2. A-4, B-2, C-1, D-3 3. A-3, B-2, C-1, D-4
4. A-4, B-3, C-2, D-1 5. A-1, B-2, C-3, D-4 (.....)

23. අග්‍ර කළමනාකරුවන් සඳහා සංකල්පනාත්මක කුසලතා වැඩිපුර අවශ්‍ය වන්නේ,

1. එදිනෙදා ව්‍යාපාර කටයුතු සාර්ථක කරගැනීම සඳහා 2. තීරණ වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා
3. අන්තර් පුද්ගල කුසලතා වර්ධනය සඳහා 4. දිගු කාලීන උපාය මාර්ගික තීරණ ගැනීම සඳහා
5. පහළ මට්ටමේ කළමණාකරුවන් අධීක්ෂණය සඳහා (.....)

24. සැලසුම්කරණයේ අරමුණු වන්නේ

1. කාර්ය සාධනය මැනීම හා නිවැරදි කිරීමය
2. පරමාර්ථ හා අරමුණු ස්ථාපිත කිරීමත් ඒවා ළඟා කරගැනීමේ මාර්ග තීරණය කිරීමත්ය
3. සේවකයින් විසින් ඉටුකළයුතු කාර්‍ය තීරණය කිරීමය
4. කාර්‍ය ඉටු කිරීමට අවශ්‍ය බලතල සහ වගකීම් පැවරීමය
5. ප්‍රමිති ස්ථාපිත කිරීමය (.....)

25. මෙහෙයුම් කළමණාකරණයට අයත් ප්‍රධාන කාර්‍යයක් නොවන්නේ,

1. නිෂ්පාදන ඉංජිනේරුකරණය 2. නිෂ්පාදන සැලසුම්කරණය
3. ද්‍රව්‍ය මිලදී ගැනීම 4. පර්යේෂණ හා සංවර්ධනය
5. තත්ව පද්ධති කළමණාකරණය (.....)

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

26. ද්‍රව්‍ය මිලදී ගැනීමේ ක්‍රියාවලියේ අවස්ථා පහත දක්වා ඇත,

A ද්‍රව්‍ය ඇණවුම් කිරීම
B ද්‍රව්‍ය අවශ්‍යතාවය මිලදී ගැනීමේ දෙපාර්තමේන්තුවට දැනුම් දීම
C ගෙවීම් වලට අදාළ කටයුතු
D සැපයුම්කරුවෙකු සොයා ගැනීම
E ද්‍රව්‍ය ලබාගැනීම

ඉහත අවස්ථා **නිවැරදිව** අනුපිළිවෙලින් පෙළ ගස්වා ඇති පිළිතුර තෝරන්න,

1. D B A C E
2. B D C A E
3. D B A E C
4. B D A E C
5. B D A C E


(.....)

27. යළි ඇණවුම් මට්ටම ගණනය කරනු ලබන්නේ මින් කවර ආකාරයකටද?

1. යළි ඇණවුම් ප්‍රමාණය - (සාමාන්‍ය තොග භාවිතය X සාමාන්‍ය ඇණවුම් කාලය)
2. අවම තොග භාවිතය X උපරිම ඇණවුම් කාලය
3. උපරිම තොග භාවිතය X අවම ඇණවුම් කාලය
4. අවම තොග භාවිතය X අවම ඇණවුම් කාලය + යළි ඇණවුම් ප්‍රමාණය
5. සාමාන්‍ය තොග භාවිතය X සාමාන්‍ය ඇණවුම් කාලය

(.....)

28.




මෙම ප්‍රස්ථාරයේ X Y Z වලින් පිළිවෙලින් නිරූපණය කරන්නේ

1. පවත්වාගෙන යාමේ පිරිවැය, ඇණවුම් කිරීමේ පිරිවැය හා ආර්ථික ඇණවුම් ප්‍රමාණයයි
2. පවත්වාගෙන යාමේ පිරිවැය, අවම පිරිවැය හා ආර්ථික ඇණවුම් පිරිවැයයි
3. ඇණවුම් කිරීමේ පිරිවැය, පවත්වාගෙන යාමේ පිරිවැය හා ආර්ථික ඇණවුම් පිරිවැයයි
4. ආර්ථික ඇණවුම් පිරිවැය, ආර්ථික ඇනවුම් ප්‍රමාණය හා පවත්වාගෙන යාමේ පිරිවැයයි
5. පවත්වාගෙන යාමේ පිරිවැය, ඇණවුම් කිරීමේ පිරිවැය හා ආර්ථික ඇණවුම් පිරිවැයයි

(.....)

29. ''කිසියම් නිෂ්පාදිතයක් පිළිබඳව පාරිභෝගිකයාගේ මනසෙහි යහපත් ආකල්පයක් ගොඩනැගීම'' යන්න අලෙවිකරණයේදී හැඳින්වෙන්නේ,

1. සම්බන්ධතා ලෙසය
2. වටිනාකම් ලෙසය
3. නිරත වීම ලෙසය
4. හැඟීම ලෙසය
5. පිහිටුවීම ලෙසය

(.....)

30. 'වටිනාකම' අලෙවිකරණයේ හර සංකල්පයකි. වටිනාකම සම්බන්ධයෙන් **වැරදි** අදහසක් ගෙනෙන අංකය තෝරන්න

1. වටිනාකම යනු පාරිභෝගික අවශ්‍යතා ඉටු කිරීමට නිෂ්පාදිතයකට ඇති හැකියාව පිළිබඳව පාරිභෝගික තක්සේරුවයි.
2. වටිනාකම ගුණත්වය, සේවා හා මිල යන ත්‍රිවිධ සාධක හා බැඳී පවතී.
3. නිෂ්පාදිතයක ගුණත්වය වැඩිවන විට වටිනාකමද වැඩි වේ.
4. නිෂ්පාදිතයක මිල වැඩිවන විටද එහි වටිනාකම වැඩිවේ.
5. නිෂ්පාදිතයක වටිනාකම ඉහළ නැංවීම සඳහා එය සපයනු ලබන සේවා හොඳ තත්වයෙන් තිබිය යුතුය.

(.....)

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

- **අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31. (අ) වෙළඳපොළ කොටස පිළිබඳව දැනගැනීමේ එක් අරමුණකින් ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවය ............................................. ලෙස හඳුන්වනු ලබන අතර ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා ගැනීමට උනන්දුවක් දක්වන පාර්ශවය ............................................. ලෙස හැඳින්වේ.

(ආ) බදු සහන ලබා ගැනීමේදී ව්‍යාපාරයකට ඇල්මැති පාර්ශවයක් ලෙස ............................................. වැදගත් වන අතර ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට ....................................... වැදගත් වේ.

32. (අ) තිරසාර සංවර්ධනය මූලික කරගත් ව්‍යාපාර ආයතන විසින් ලාභය මෙන්ම .................................................හා ................................................. පිළිබඳවද සැලකිලිමත් විය යුතුය.

(ආ) ව්‍යාපර ආයතනයක් ............................................ වලට අනුකූලව කොතෙක් දුරට කටයුතු කරනවාද යන්න පිළිබඳවත්, ව්‍යාපාරයේ සමාජ වගකීම් කොතෙක් දුරට ඉටුකරනවාද යන්න පිළිබඳවත් තුන්වන පාර්ශවයක් විසින් සිදුකරනු ලබන විමර්ශනය ...................................................... ලෙස හඳුන්වයි.

33. (අ) රජයක් තම අරමුණු ඉටුකරගැනීම සඳහා දරනු ලබන වියදම් ........................හා......................... යනුවෙන් ප්‍රධාන ශීර්ෂ දෙකකි.

(ආ) රජයේ ආදායම ......................................... ආදායම හා ......................................... නොවන ආදායම ලෙස කොටස් දෙකකි.

34. (අ) සමාගමක ප්‍රාග්ධන සම්පාදනයේදී ප්‍රසිද්ධියේ මහජනතාවට කොටස් හෝ ණයකර නිකුත් කල නොහැකි සමාගම් ....................................................... වන අතර සාමාජික සංඛ්‍යාව අවමය 1 උපරිමය සීමාවක් නොමැති සමාගම් ........................................................ වේ.

(ආ) එක සමාන ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින සමාගම් දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ වීම ................................................. වන අතර, කිසියම් නිෂ්පාදිතයක යෙදෙන ව්‍යාපාර දාමයේ විවිධ අවස්ථා වල යෙදී සිටින සමාගම් කිහිපයක් ඒකාබද්ධවීම ............................................................... වේ.

35. (අ) නව ව්‍යාපාරයක් දියත් කොට සාර්ථකව පවත්වාගෙන යාමට ඇති හැකියාව ව්‍යවසායකත්වය ලෙස ............................................................................................................. විසින් ඉදිරිපත්කර ඇති නිර්වචනයයි. සංවිධානයක වෙනස්කම් හඳුන්වාදෙන ආයතනයක් තුල ක්‍රියාත්මක වන ව්‍යවසායකත්වය ................................................. ලෙස හැඳින්වේ.

(ආ) වෙනස් ආකාරයට දැකීම, සිතීම හා ක්‍රියාකිරීම ව්‍යාවසායකයකුගේ ........................................... දක්වන ගති ලක්ෂණයක් වන අතර, වෙනත් අයගේ අදහස් මත යැපෙන්නෙකු නොවී තමන්ගේ අදහස් හා හැකියා හැකිතරම් දුරට ක්‍රියාත්මක කිරීමට ඇති කැමැත්ත ..................................................... යි.

36. (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීමට රජය ගෙන ඇති පියවර ..................................................... හා ........................................................... ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.

(ආ) ප්‍රාදේශීය සංවර්ධන බැංකු හරහා .......................................................... ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන අතර DFCC බැංකුව හා අනෙකුත් වාණිජ බැංකු සම්බන්ධවී ........................................................ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

37. (අ) රජයේ සුරැකුම්පත් ප්‍රථම වතාවට අලෙවි කොට මුදල් ලබා ගන්නා වෙළඳපොල .............................................. වේ. මෙම වෙළඳපොලට සහභාගි වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබාදී ඇති ආයතන .................................................. ලෙස හැඳින්වේ.

(ආ) සංස්ථාපිත සමාගම්වල කොටස් හෝ ණයකර විකිණීම හා මිලට ගැනීම සම්බන්ධව කටයුතු කිරීමට අතරමැදියන් ලෙස කටයුතු කරන ආයතන ....................................................... වේ. මෙම ආයතන ව්‍යාපාරික කටයුතු කිරීම සඳහා .................................................. බලපත්‍රයක් ලබාගත යුතුවේ.

38. (අ) වාණිජ බැංකු සපයන ප්‍රධාන සේවාවන් දෙක වන්නේ 1. ........................................................................ හා 2. .................................................................. වේ.

(ආ) ඒකකභාරයක් රැස්කරගත් මුදල් ........................................................... විසින් ........................................ යොදවනු ලැබේ.

39. (අ) ප්‍රවාහනයේ ................................................................ සඳහා ............................................... වර්ධනයක් අවශ්‍ය වේ.

(ආ) ගබඩාවක් ස්ථානගත කිරීමේදී සලකා බැලිය යුතු වන්නේ ............................................... හා ................................................ කොතරම් වේගයෙන් සිදුවන්නේද යන්න හා ඉදිරියේදී කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් මොනවාද යන්නයි.

40. (අ) කළමණාකරන කුසලතා හඳුන්වාදුන් පුද්ගලයා ........................................................ වන අතර කළමණාකරුවන්ගේ භූමිකා හඳුන්වාදුන් පුද්ගලයා ............................................... වේ.

(ආ) සේවකයින් වෙත ............................................ හා ............................................................. විධිමත්ව පවරා දීමේ ක්‍රියාවලිය බලතල පැවරීම ලෙස හැඳින්වේ.

- **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

41. ගෝලීය පරිසරය තුල ඇතිවිය හැකි පාරිසරික බලපෑම් 04 ක් සඳහන් කරන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................
    3. ..........................................................................................................................
    4. ..........................................................................................................................

42. හවුල් ව්‍යාපාරයක අනිවාර්යයෙන්ම තිබිය යුතු ලක්ෂණ 04 ක් සඳහන් කරන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................
    3. ..........................................................................................................................
    4. ..........................................................................................................................

43. බලපත්‍රලාභී විශේෂිත බැංකු 04 ක් සඳහන් කරන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................
    3. ..........................................................................................................................
    4. ..........................................................................................................................



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

44. ස්වයංක්‍රීය බැංකු සේවා නිසා බැංකුවලට අත්වන වාසි 04 ක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................

45. විධිමත් භාණ්ඩ ඇසිරීමෙන් සහ ගබඩාව තුළ භාන්ඩ එහා මෙහා කිරීමේ උපකරණ භාවිතා කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන 04 ක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................

46. නිදහස් වෙළඳමාට බලපාන තීරුබදු නොවන බාධා 04 ක් නම් කරන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................

47. මධ්‍ය කළමණාකරණ මට්ටමට අයත් තනතුරු සඳහා උදාහරණ 04 ක් ලියන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................

48. කාර්ය නිෂ්පාදනයේ අහිතකර ලක්ෂණ 04ක් ලියන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................

49. තම ආයතනයේ තත්ත්ව පාලන කටයුතු සඳහා ආයතනයකට භාවිතා කළ හැකි ශිල්පීය ක්‍රම 04ක් නම් කරන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................

50. නිෂ්පාදන සංකල්පය තුළ අලෙවිකරුවන්ගේ අවධානය යොමු වූ කාර්‍යයන් 04ක් ලියන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

32 | S | II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

# ව්‍යාපාර අධ්‍යයනය II

කාලය පැය තුනයි

- **උපදෙස් :- ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**
- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. (i) (අ) ව්‍යාපාරවල ගති ලක්ෂණ 04ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ආ) ඇතැම් භාණ්ඩ වල මෝස්තරය කල්ඉකුත්වී භාවිතයෙන් ඉවත්වීමට ව්‍යාපාරිකයින් නව උවමනා නිර්මාණය කිරීම බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) (අ) ශ්‍රම විභජනය හා විශේෂීකරණය ව්‍යාපාරයක ඵලදායීතාව ඉහලනැංවීමට හේතුවන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමග ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදුවී ඇති ප්‍රවණතා 04ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) නිෂ්පාදිතයේ ස්වාභාවය අනුව ව්‍යාපාර වර්ග කර දක්වා ඉන් කොටස් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) (අ) ව්‍යාපාර කාර්යයන් 04ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) සේවකයින් නිසා ව්‍යාපාරයකට ඇතිවිය හැකි දුර්වලතා 04ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(v) (අ) ව්‍යාපාරයක සමාජ වගකීම් හා ආචාරධර්ම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ආ) ව්‍යාපාරයක් විසින් සමාජයට සිදුකරනු ලබන අවාසිදායක බලපෑම් හා ඒවා අවම කිරීමට ව්‍යාපරයක් විසින් ගතහැකි පියවර පැහැදිලි කරන්න.

02. (i) පාසලේ පැවති ක්‍රීඩා උත්සවයේදී ක්‍රීඩා තරග සඳහා සහභාගි වූ සිසුන්ට ක්‍රීඩාව අවසානයේ ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙක් විසින් නොමිලේ කිරි පැකට් බෙදාදෙන ලදී. ක්‍රීඩා උත්සවය අවසන් වීමටත් පෙර කිරි පානය කළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බරපතල ලෙස රෝගාතුරව රෝහල්ගත කිරීමට සිදුවිය. විදුහල්පතිතුමා හා සාකච්ඡා කළ බොහෝ අය පැවසුවේ එම කිරි පැකට් කල් ඉකුත්වී ඇතිබවත් එයින් පාරිභෝගික අයිතිවාසිකම් කඩවී ඇතිබවත්ය. ඒ සම්බන්ධ නීතිමය පියවර ගතයුතු බවත් ඔවුන්ගේ අදහස විය.

(අ) ඉහත සිදුවීම මගින් කඩවී ඇති පාරිභෝගික අයිතිවාසිකම් දෙකක් පෙන්වමින් සිදුවූ අකටයුත්ත පැමිණිලි කල හැකි පාර්ශව දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) පාරිභෝගිකයෙකු ලෙස භාණ්ඩයක් තෝරා ගැනීමේදී ඔබගේ අවධානය යොමුකළයුතු සාධක හතරක් දක්වන්න (ලකුණු 2)

(ii) (අ) සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලියකියවිලි මොනවාද? (ලකුණු 2)

(ආ) ඒ සඳහා ලියකියවිලි ඉදිරිපත් කල යුත්තේ කා වෙතද? (ලකුණු 2)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(iii) (අ) කේවල ස්වාමි ව්‍යාපාරවල දැකියහැකි වාසි හා සීමා හතර බැගින් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) හවුල් ව්‍යාපාරයකට අදාල නීති මූලාශ්‍ර හතරක් සඳහන්කර ඒවායේ අදාලත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 2)

(iv) (අ) සංස්ථාපිත සමාගම්වල සුවිශේසී ලක්ෂණ හතරක් සඳහන් කරන්න (ලකුණු 2)

(ආ) 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ආරම්භකළ හැකි ප්‍රධාන සමාගම් වර්ග මොනවාද? (ලකුණු 2)

(v) (අ) වරලත් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කැමැත්තෙන් සිටින නිමල්ට ඒ පිළිබඳ තොරතුරු දැනගැනීමට අවශ්‍යව ඇත. වරලත් ව්‍යාපාර ක්‍රමය යටතේ ආරම්භ කල හැකි වරලත් ව්‍යාපාර වර්ග මොනවාදැයි උදාහරණ සහිතව ඔහුට පැහැදිලි කර දෙන්න. (ලකුණු 2)

(ආ) වරලත් ව්‍යාපාර ක්‍රමයෙන් වරලත් ලාභියාට අත්වන වාසි දෙකක් හා සීමා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

03. (i) ව්‍යාපාර සංයෝජනය වී කටයුතු කිරීම ව්‍යාපාර ක්ෂේත්‍රයේ නව ප්‍රවනතාවක් ලෙස දැක්විය හැකිය.

(අ) ව්‍යාපාර සංයෝජනය ලෙස හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 2)

(ආ) ව්‍යාපාර සංයෝජන වීම දෙආකාරයකින් සිදුකළ හැක. ඒ මොනවාද? පැහැදිලිකරන්න. (ලකුණු 2)

(ii) (අ) හරිත ව්‍යවසායකත්වය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 2)

(ආ) ව්‍යවසායකත්වය තුලින් සමාජයට හා ආර්ථිකයට අත්වන ප්‍රතිලාභ 4ක් සඳහන් කරන්න (ලකුණු 2)

(iii) (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේදී මෙන්ම ඒවා පවත්වාගෙන යාමේදී සැලකිලිමත් විය යුතු කරුනු 4ක් සඳහන් කරන්න (ලකුණු 2)

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති මූල්‍යමය නොවන දිරි ගැන්වීම් සඳහා නිදසුන් 4ක් දක්වන්න. (ලකුණු 2)

(iv) (අ) ඒකක භාරයක පාර්ශව අතර සම්බන්ධය සටහනක් මගින් දක්වන්න. (ලකුණු 2)

(ආ) ආයෝජන කළමණාකරුවන් සපයන සේවාවන් 4ක් දක්වන්න. (ලකුණු 2)

(v) (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සමන්විත වන ආකාරය සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජ්‍යායතන කාර්‍යයන් සඳහන් කරන්න (ලකුණු 2)

04. (i) (අ) සීමාසහිත ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගම විසින් ඉටු කරනු ලබන නිශ්කාශන සේවාවන් මොනවාද? (ලකුණු 2)

(ආ) ජංගම ගිණුම් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයෙකුට ලබාගත හැකි පහසුකම් 4ක් සඳහන් කරන්න (ලකුණු 2)

(ii) (අ) වාණිජ බැංකු ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවලදී ගනුදෙනුකරුවන් වෙනුවෙන් නියෝජිතයෙකු ලෙස කටයුතු කරයි. වාණිජ බැංකු විසින් ඉටුකරන නියෝජිත සේවා 4ක් දක්වන්න. (ලකුණු 2)

(ආ) චෙක්පත් රේඛණය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? චෙක්පත් රේඛණය කිරීමේ අවශ්‍යතාවය කරුනු 3කින් දක්වන්න. (ලකුණු 2)

(iii) (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු 2 සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න.(ලකුණු 2)

(ආ) තත්කාලීන දළ පියවීම් පද්ධතිය යනු කුමක්දැයි පැහැදිලි කර එහි වැදගත්කම දක්වන්න. (ලකුණු 2)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

(iv) (අ) චෙක්පතක් පිටසන් කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 2)

(ආ) චෙක්පතකට පිටසන යෙදීම අවශ්‍ය වන අවස්ථා 02ක් සඳහන කරන්න. (ලකුණු 2)

(v) (අ) චෙක්පතක දැක්විය හැකි සාමාන්‍ය රේඛණ ක්‍රම 2ක් ඇඳ ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න (ලකුණු 2)

(ආ) චෙක්පත් රේඛණය කිරීමෙන් අණකරු අපේක්ෂා කරන්නේ කුමක්ද? (ලකුණු 2)

## II කොටස

05. (i) (අ) රක්ෂණය කළ නොහැකි අවදානම් සඳහා නිදසුන් 4ක් දක්වන්න.

(ආ) රක්ෂණ ගිවිසුමක් වලංගුවීම සඳහා පැවතිය යුතු මූලිකාංග මොනවාද?

(ii) (අ) ගිනි රක්ෂණ ඔප්පුවක් යටතේ ගිනි හානිවලට අමතරව ආවරණය කරගත හැකි අනෙකුත් අවදානම් මොනවාද?

(ආ) රක්ෂණ ගිවිසුමක් වලංගුවීම සඳහා පැවතිය යුතු මූලිකාංග මොනවාද?

(ඇ) වගකීම් රක්ෂණය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? මේ යටතේ ලබාගත හැකි රක්ෂණ ඔප්පු වර්ග 2ක් දක්වන්න.

(iii) (අ) ව්‍යාපාරික කටයුතු සඳහා සන්නිවේදනයේ වැදගත්කම කරුණු 4ක් මගින් දක්වන්න

(ආ) සන්නිවේදන ක්‍රියාවලිය රූප සටහනක් මගින් දක්වන්න

(iv) (අ) උචිත ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේදී භාණ්ඩයේ ස්වාභාවය මත තෝරාගන්නා මාධ්‍යයද වෙනස්වේ. පහත සඳහන් භාණ්ඩ ප්‍රවාහනය සඳහා සුදුසු මාධ්‍යය සඳහන් කරන්න

1. ඛනිජ තෙල් 2. දැව 3. මාළු 4. පළතුරු

(ආ) වර්තමානයේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රවණතා වර්ධනය වෙමින් පවතී. ඊට නිදසුන් 4ක් දක්වන්න.

(v) ආයතනවල ස්වරූපය, නිෂ්පාදිතවල ස්වරූපය අනුව විවිධ ආකාරයේ ප්‍රවාහන සැපයුම් සේවා පද්ධති පවතී. එම පද්ධතීන් සඳහන්කර ඊට නිදසුන් බැගින් දක්වන්න. (ලකුණු 20)

06. (i) (අ) නිෂ්පාදිත මිලදී ගැනීමේ හා විකිණීමේ ක්‍රියාවලිය වෙළඳාමයි. වෙළදාමේ ප්‍රභේද දැක්වීමට ගැලීම් සටහනක් අදින්න.

(ආ) අපනයන වෙළඳාමේ උප ප්‍රභේද 02කි. නම් කර ඒවා අතර වෙනස්කම් 02ක් ලියන්න.

(ii) (අ) විදේශ වෙළඳාමේදී භාවිතා වන පහත ලියකියවිලි කෙටියෙන් හඳුන්වන්න.

1. ප්‍රභවස්ථාන සහතිකය 2. අපනයන සටහංකරය

(ආ) සංවිධානයක සාර්ථකත්වය සඳහා කළමණාකරණය ඉතා වැදගත්ය. 'කළමණාකරණය' යන්න හඳුන්වන්න

(iii) (අ) වර්තතමානයේදී කළමණාකරණය පෙරට වඩා වැදගත්වීමට හේතුවිය හැකි කරුණු 04ක් ලියන්න.

(ආ) කළමණාකරණ ක්‍රියාවලියේ උපක්‍රියාවලීන් නම් කරන්න.

(iv) පහත සඳහන් කළමණාකරණ සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

1. කාර්යක්ෂමතාවය 2. සඵලදායකත්වය 3. ඵලදායකත්වය

(v) (අ) පාලන විතස්තීය හෙවත් පාලන අවකාශය යන්න හඳුන්වන්න

(ආ) පාලන අවකාශය තීරණය කිරීමට බලපාන කරුණු 02ක් නම් කරන්න. (ලකුණු 20)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.
NWP-EXAM

07. (i) (අ) සංවිධාන ව්‍යුහයක් ඉතා පහසුවෙන් දැක්විය හැක්කේ සංවිධාන සටහනක් මගිනි සංවිධාන සටහනක් දැක්විය හැකි ප්‍රධාන ආකාර 03 නම් කරන්න

(ආ) "බලය" හා "අධිකාරිය" අතර වෙනස ලියන්න.

(ii) (අ) කළමණාකරණ උපක්‍රියාවලියක් වන මෙහෙයවීමට අයත් ප්‍රධාන අංශ තුන නම් කරන්න.

(ආ) සේවක අභිප්‍රේරණය යන්න හඳුන්වන්න.

(iii) හෙන්රි මින්ට්ස්බර්ග් (Henry Mintzberg)ට අනුව කළමණාකරුවන් විසින් ඉටුකළ යුතු ප්‍රධාන කාර්‍යයන් තුන නම් කර ඒවාට අයත් උප ශීර්ෂයන් ඉදිරියෙන් දක්වන්න.

(iv) (අ) මෙහෙයුම් කළමණාකරණයේ මූලික කාර්‍යය ලියා දක්වන්න.

(ආ) පරිවර්තන ක්‍රියාවලිය රූප සටහනක් මගින් ඉදිරිපත් කරන්න.

(v) (අ) නිෂ්පාදන ආයතනයකට තෝරා ගතහැකි විවිධ නිෂ්පාදන ක්‍රම නම් කරන්න.

(ආ) නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේදී ආයතනයක් වසින් සලකා බැලිය යුතු කරුණු 04ක් සඳහන් කරන්න. (ලකුණු 20)

08. (i) (අ) "කම්හල් පිරියත සැලසුම් කිරීම'' ලෙස හැඳින්වෙන්නේ කුමක්ද?

(ආ) කම්හල් පිරියත සැලසුම් ක්‍රමයක් වන ස්ථාවර ස්ථානීය පිරියත ක්‍රමය හඳුන්වන්න.

(ii) (අ) නිෂ්පාදන ආයතනයකට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- ස්ථාවර පිරිවැය - රු. 20 000/=
- ඒකකයක විචල්‍ය පිරිවැය - රු. 5/=
- ඒකකයක විකුණුම් මිල - රු. 10/=

මෙම ව්‍යාපාරයේ සමච්ඡේදන ලක්ෂයට අදාල ඒකක ප්‍රමාණය ගණනය කරන්න.

(ආ) සමච්ඡේදන ලක්ෂ විග්‍රහයේ සීමා 02ක් නම් කරන්න.

(iii) "තොග පාලනය" යන්න කෙටියෙන් හඳුන්වා තොග පාලනයක අවශ්‍යතාවය මතු කරන කරුණු 4ක් නම් කරන්න.

(iv) (අ) නිෂ්පාදන ආයතනයකට භාවිතා කළහැකි තත්ව පාලන ශිල්පීය ක්‍රම 04ක් නම් කරන්න.

(ආ) "ශුන්‍ය දෝෂ" තත්ත්ව පාලන ශිල්පීය ක්‍රමය කෙටියෙන් පැහැදිලි කරන්න.

(v) අ) අලෙවිකරණ හර සංකල්ප අතර "හැඟීම හා නිරතවීම" (Impressions and satisfaction )ඉතා වැදගත්ය. හැඟීම් හා නිරත වීම යන්න පැහැදිලි කරන්න

ආ) දී ඇති විස්තරයට අදාළ අලෙවිකරණ දර්ශනය හඳුනාගෙන නම් කරන්න.

1. තරගකාරී විකුණුම් ප්‍රතිපත්ති හා විකුණුම් ප්‍රවර්ධන ක්‍රම අනුගමනය කිරීමෙන් විකුණුම් වැඩි කර ගැනීමට කටයුතු කිරීම.
2. සියලු අලෙවිකරණ උපක්‍රම ඒ ඒ ගනුදෙනුකරු මුල් කරගෙන සිදු කරමින් විකුණුම් වැඩි කරගැනීමට උත්සහ කිරීම.
3. අලෙවිකරණයේ සියලුම සංරචක එකම අරමුණකින් යුතුව ක්‍රියාත්මක කිරීම.
4. නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ නිපදවීම වෙනුවට අලෙවිකළ හැකි භාණ්ඩ නිපදවීමට කටයුතු කළ යුතු බව අවධාරණය කිරීම. (ලකුණු 20)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

# පළමු වාර පරීක්ෂණය - 2020
# 13 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු
## I පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| (01) | - 4 | (11) | - 5 | (21) | - 2 |
| (02) | - 2 | (12) | - 3 | (22) | - 1 |
| (03) | - 5 | (13) | - 4 | (23) | - 4 |
| (04) | - 4 | (14) | - 3 | (24) | - 2 |
| (05) | - 4 | (15) | - 2 | (25) | - 5 |
| (06) | - 1 | (16) | - 3 | (26) | - 4 |
| (07) | - 2 | (17) | - 4 | (27) | - 3 |
| (08) | - 4 | (18) | - 3 | (28) | - 1 |
| (09) | - 3 | (19) | - 3 | (29) | - 5 |
| (10) | - 2 | (20) | - 5 | (30) | - 4 |

31. (අ) අයිතිකරු, පාරිභෝගිකයා (ආ) රජය, අයිතිකරුවන්
32. (අ) පුද්ගලයින්/සමාජය, පරිසරය/විශ්වය (ආ) ව්‍යාපාර ආචාරධර්ම, සමාජ විගණනය
33. (අ) වර්ථන, ප්‍රාග්ධන (ආ) බදු, බදුනොවන
34. (අ) සීමිත පෞද්ගලික සමාගම්, සීමිත පොදු සමාගම් (ආ) තිරස් සංයෝජනය, සිරස් සංයෝජනය
35. (අ) අන්තර්ජාතික කම්කරු සංවිධානය, අභ්‍යන්තර ව්‍යවසායකත්වය (ආ) නිර්මාණශීලී බව, ස්වාධීන බව
36. (අ) මූල්‍යමය දිරිගැන්වීම්, මූල්‍යමය නොවන දිරි ගැන්වීම් (ආ) ලිය ඉසුරු, සහන්‍යා
37. (අ) ප්‍රාථමික වෙළඳපොළ, ප්‍රාථමික අලවිකරු (ආ) තැරැව්කාර සමාගම්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
38. (අ) තැන්පතු ආශ්‍රිත සේවා, ණය ආශ්‍රිත සේවා (ආ) වෘත්තීය අරමුදල් කළමණාකරුවන්, ආයෝජන කළඹක
39. (අ) තුලිත සංවර්ධනයක්, ප්‍රවාහන මූලිකාංග වල (ආ) භාණ්ඩ ඇසිරීම, ආපසු ලබාගැනීම
40. (අ) රොබට් එල් කර්ට්ස්, හෙන්රි මින්ට්ස්බර්ග් (ආ) වගකීම්, අධිකාරිය
41. වෙළඳ ගිවිසුම් ඇතිවීම - වෙළඳ හවුල් ඇතිවීම - ලෝක සංවිධාන බිහිවීම
    අන්තර් ජාතික වශයෙන් නීති රීති ඇතිවීම
42. ලාභ ලැබීමේ අරමුණ - ව්‍යාපාර කටයුත්තක් පැවතීම- පුද්ගලයින් සිටීම - අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් තිබීම
43. ජාතික ඉතිරි කිරීමේ බැංකුව - ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
    රාජ්‍ය උගස් හා ආයෝජන බැංකුව - වෙනත්
44. පිරිවැය අඩුවීම - තදබදය අඩුවීම - නිරවද්‍යතාව ඉහළවීම -කාර්‍යමණ්ඩලය අඩුකරගත හැකි වීම හෝ වෙනත්
45. ගබඩාව වඩාත් සංවිධානාත්මක වීම - අසුරන ලද නිෂ්පාදිත වලට හා සේවකයන්ට ආරක්ෂාකාරී වීම
    දැරිය යුතු පරිශ්‍රමය හා කාලය ඉතිරීවීම - ගබඩාවේ ඉඩකඩ ඉතිරිවීම
46. ආනනයන සීමා කිරීම/ පංගු කිරීම - අපනයන සීමා කිරිම/පංගු කිරීම
    ආනයන අපනයන තහනම් කිරීම - වෙළඳ ගිවිසුම්
47. අලෙවිකළමණාකරු - මූල්‍ය කළමණාකරු - මානවසම්පත් කළමණාකරු - මෙහෙයුම් කළමණාකරු
    - පර්යේෂණ හා සංවර්ධන කළමණාකරු
48. 1. පිරිවැය ඉහළවීම 2. සෑම විටම කුසලතා සහිත පුහුණු සේවකයන් අවශ්‍ය වීම
    3. විශේෂ උපකරණ හා මෙවලම් අවශ්‍යවීම 4. වෙළෙඳ පොළ මුල් කරගෙන නිෂ්පාදනය සිදු නොවීම
49. 1. තත්ත්ව කව 2. ශුන්‍ය දෝෂ 3. තත්ව ආරක්ෂණය
    4.ගුණත්ව ප්‍රමිති 5. සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය
50. 1. නිෂ්පාදකයන්ට නිපදවිය හැකි භාණ්ඩ නිපදවීම 2. නිෂ්පාදන ධාරිතාවය හැකිතාක් ඉහළ දැමීම
    3. නිෂ්පාදන ඒකක මිල අඩුකිරීම (අඩු පිරිවැය) 4.බෙදාහැරීම වඩාත් පුළුල්ව සහ කාර්‍යක්ෂමව සිදු කිරීම

## II - කොටස

01. (i) (අ) *විකුණුම් හෝ හුවමාරුව සිදුවීම *භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදුවීම *ගණුදෙනු අඛණ්ඩව සිදුවීම
*ලාභයෙන් අභිප්‍රේරණය වීම *අවදානමක් තිබීම *වුවමනා නිර්මාණය කිරීම
*ආර්ථික කටයුත්තක් වීම (කරුණු 4කට ලකුණු 2යි)

(ආ) ව්‍යාපාරිකයින් විසින් නව වුවමනා නිර්මාණය කරණ විට නව මාදිලියේ භාණ්ඩ වෙළඳපොළට පිවිසේ. එවිට පැරණි මාදිලි වල භාණ්ඩ වලට ඇති ඉල්ලුම ශීඝ්‍රයෙන් අඩුවී එවැනි භාණ්ඩ කාලයත් සමග වෙළඳපලින් ඉවත්වේ. (පැහැදිලි කිරීමට ලකුණු 2යි)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(ii) (අ) ශ්‍රම විභජනය හා විශේෂිකරණය තුලින් ව්‍යාපාරයක නිෂ්පාදන ක්‍රියාවලියේ වේගවත්බව, නිෂ්පාදිතවල ගුණාත්මක බව හා නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහලයයි. එම නිසා ආයතනයේ නිමැවුම ඉහලගොස් ඵලදායීතාව වැඩිවේ. (පැහැදිලි කිරීමට ලකුණු 2යි)

(ආ) *ගෝලීයකරණය ව්‍යාප්තවීම *විද්‍යුත් ව්‍යාපාර බිහිවීම *විද්‍යුත් මුදල් භාවිතයට පැමිණීම *පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම *ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳ සැලකිලිමත්වීම(කරුණු 4ට ලකුණු 2යි)

(iii) *ප්‍රාථමික *ද්විතීයික *තෘතියික (කරුණු 03ම සඳහන්කර ඇත්නම් ලකුණු 02යි. ඉන් ඕනෑම කොටස් දෙකක් නිවැරදිව පැහැදිලි කර ඇතිනම් ලකුණු 02 මුළු ලකුණු 04යි)

(iv) (අ) පරිපාලනය - නිෂ්පාදනය - අලෙවිකරණය - මූල්‍ය කටයුතු - මානව සම්පත් කටයුතු - පර්යේෂණ හා සංවර්ධන කටයුතු - තොරතුරු කළමණාකරණ කටයුතු (කරුණු 4ට ලකුණු 2)

(ආ) - නුපුහුණු සේවකයින් සිටීම - අයහපත් වැඩ පුරුදු පැවතීම - වගකීමකින් හා වගකීමකින් තොර තොර සේවකයින් සිටීම - සමාන ආකල්ප පැවතීම - අකාර්යක්ෂම සේවකයින් සිටීම (කරුණු 4ට ලකුණු 2)

(v) (අ) ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන සියලු පාර්ශවයන්ගේ සුභසිද්ධිය තහවුරුවන පරිදි ක්‍රියාකිරීමට ව්‍යාපාරයක් සතු නෛතික හා සදාචාරාත්මක බැදීම සමාජවගකීමයි. ව්‍යාපාර ආචාරධර්ම යනු හොඳ නරක පිළිබඳ මනා වැටහීමකින් ව්‍යාපාරයක් ක්‍රියා කිරීමයි. එනම් නීතිරීති අනුගමනය කරන අතරම සාධාරණ වීම, සත්‍යවාදීවීම, අන් අයට හානි නොකිරීම වැනි කරුණු ආචාරධර්ම මගින් අවධාරණය කෙරේ. ව්‍යාපාර ආචාරධර්මවලට අනුකූලව ව්‍යාපාරයක් හැසිරීම ව්‍යාපාරයක සමාජ වගකීම නිරායාසයෙන්ම ඉටුවීමකි. (ලකුණු 2)

(ආ) අවාසිදායක බලපෑම්

1. රසායන ද්‍රව්‍ය ජලයට හා ගොඩබිමට එකතු කිරීම.
2. දිරාපත් නොවන ප්ලාස්ටික් හා පොලිතීන් වැනි ද්‍රව්‍යයන් පරිසරයට එක්කිරීම.
3. පරිසරයට අධික ශබ්දය මුදාහැරීම මගින් ශබ්දය දූෂණය කිරීම.
4. පරිසරයට විෂවායු මුදාහැරීම
5. ඕසෝන් ස්ථරයට හානිවිය හැකි දේ සිදු කිරීම.
6. ජෛව විවිධත්වයට හානි සිදු කිරීම (කරුණු 2ට ලකුණු 1)

අවාසි අවම කිරීමට ගතහැකි පියවර

1. අපද්‍රව්‍ය මනා ලෙස කළමනාකරණය කිරීම.
2. ඇසුරුම්කරණයේදී මෙන්ම නිෂ්පාදන කටයුතුවලදී පොලිතීන් භාවිතයෙන් බැහැරවීම.
3. හරිත නිෂ්පාදිතවලට යොමුවීම.
4. සම්පත් නාස්තිය අවමවන පරිදි කටයුතු කිරීම.

55. පරිසර සංරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම. (කරුණු 2ට ලකුණු 1)

02. (i) (අ) ආරක්ෂාව සලසා ගැනීමට ඇති අයිතිය - තොරතුරු දැනගැනීමේ අයිතිය
වන්දි ලබා ගැනීමට ඇති අයිතිය - තෝරා ගැනීමට ඇති අයිතිය

1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අධ්‍යක්ෂ ජනරාල් 2. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
3. මහජන සෞඛ්‍ය පරීක්ෂක 4. ආහාර හා ඖෂධ කොමසාරිස්

(ii) (අ) 1. ඉල්ලුම් පත්‍රය
2. අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක්
3. සමිතිය පවත්වාගෙන යාමේ ආර්ථික යෝග්‍යතාව දැක්වෙන වාර්තාවක්
4.. ලියාපදිංචිය ඉල්ලීමේ යෝජනාව සම්මත වූ මහසභා රැස්වීම් වාර්තාවක්
5. සාමාජික මුදල් පරිහරණ වාර්තාවක්
6. සමිතියට ළඟාවිය හැකි මාර්ග සිතියමක්
7. කාරක සභිකයින්ගේ ලැයිස්තුවක්

(ආ) සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත.

(iii) (අ)

| වාසි | සීමා |
|---|---|
| 1. පහසුවෙන් ආරම්භ කළ හැකි වීම. | 1. වගකීම අසීමිතවීම |
| 2. සියලු ලාභ අයිතිකරු සතු වීම | 2. නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම |
| 3. ස්වාධීන තීරණගත හැකිවීම | 3. අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම |
| 4 ව්‍යාපාර තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා වීම | 4. අලාභ තනිව භුක්ති විඳීමට සිදු වීම |



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(ආ) **නීති මූලාශ්‍රය** — **අදාලත්වය**

| නීති මූලාශ්‍රය | අදාලත්වය |
|---|---|
| 1. 1890 හවුල් ව්‍යාපාර ආඥාපනත | හවුලක ස්වාභාවය, හවුල් ඔප්පුව, ගිවිසුමක් නොමැතිවිට කටයුතු කරන ආකාරය දැක්වේ |
| 2. 1840 අංකය දරණ 07 වංචා වැලැකවීමේ ආඥාපනත | ප්‍රාග්ධනය රු. 1000 ට වැඩි නම් ලිඛිත ගිවිසුමක් අනිවාර්‍ය බව |
| 3. 2007 අංක දරණ 07 සමාගම් පනත | හවුල් ව්‍යාපාරයක සිටිය යුතු සාමාජික සංඛ්‍යාව තීරණය කිරීම |
| 4. 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥාපනත | ව්‍යාජ නමකින් පවත්වාගෙන යන ව්‍යාපාර ලියාපදංචි කිරීම |

(ලකුණු 2)

(iv) (අ) 1. සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද ආයතනයක් වීම.
2. නිත්‍ය සන්තතික හැකියාව තිබීම
3. අයිතිකරුවන්ගේ වගකීම සීමාසහිත වීම.
4. කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය රැස් කිරීම. (ලකුණු 2)

(ආ) 1. සීමා සහිත සමාගම් 2. සීමා රහිත සමාගම් 3. ඇපයෙන් සීමිත සමාගම් (ලකුණු 2)

(v) (අ) නිෂ්පාදිත වරලත් ව්‍යාපාර - නිෂ්පාදන වරලත් ව්‍යාපාර
ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර (උදාහරණ සහිතව එකිනෙක පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) **වාසි**
1. අසාර්ථක වීමේ ප්‍රවනතාව අඩුවීම
2. ජනප්‍රිය වෙළඳනාම නිසා ප්‍රචාරණය පහසුවීම (ලකුණු 1)

**සීමා**
1. විශාල පිරිවැයක් දැරීමට සිදුවීම
2. වරලත් හිමියාගේ පාලනය නිසා පූර්ණ ස්වාධීනත්වයක් හිමි නොවීම (ලකුණු 1)

03. (i) (අ) සමාගම් දෙකක් හෝ කිහිපයක් එකට එකතුවී කටයුතු කිරීම ව්‍යාපාර සංයෝජනය ලෙස හැඳින්වේ. (ලකුණු 2)

(ආ) ඒකාබද්ධ වීම, අත්පත්කර ගැනීම (පැහැදිලි කිරීම සහිතව පිළිතුරට ලකුණු 2)


(ii) (අ) පාරිසරික හෝ සමාජයීය ගැටලු හෝ අවශ්‍යතා සඳහා ඉතා ඉහල අවදානමකින් යුතුව ස්වාභාවික පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කිරීමට ව්‍යවසායකත්ව අදහස් මගින් දැනුවත් භාවයකින් යුතුව කරනු ලබන ක්‍රියාකාරකම්ය. (ලකුණු 2)

(ආ) *නව රැකියා අවස්ථා උත්පාදනය වීම
*ආදායම් අවස්ථා බිහිවීම
*නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා උදාවීම
*ජනතාවගේ ජීවන මට්ටම ඉහල යාම
*ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම
*නව වෙළඳපොලවල් සංවර්ධනය වීම
(කරුණු 4ට ලකුණු 2)

(iii) (අ) *තම හැකියා හා කුසලතා පිළිබඳව අධ්‍යනය කිරීම හා ඇගයීම
*නිෂ්පාදිතයට ඇති වෙළඳපොල හා එම වෙළඳපොලට ළගාවිය හැකිද යන්න
*ආරම්භක ප්‍රාග්ධනය හා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය පිළිබඳව අධ්‍යනය කිරීම
*ව්‍යාපාර සංවිධාන ක්‍රමය පිළිබඳ අධ්‍යනය
*ව්‍යාපාර සංවිධාන ක්‍රමය හා පවතින නීතිරීති
*පවතින තරගකාරීත්වය (කරුණු 4ට ලකුණු 2)

(ආ) *උපදේශන සේවා *පර්යේෂණ හා තාක්ෂණික සේවා *වෙළදපොල පහසුකම් ලබාදීම
*විශිෂ්ටතා සම්මාන ලබාදීම *ව්‍යවසායක සංවර්ධන වැඩ සටහන් *යටිතල පහසුකම් සැපයීම
(කරුණු 4ට ලකුණු 2)

(iv) (අ)




(ලකුණු 2)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

(ආ) *නිකුතුව පිළිබඳව ආයෝජන ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම *ආයෝජන ඉල්ලුම්පත්‍ර භාර ගැනීම
*ආයෝජකයින්ට සුරැකුම් බෙදාදීම *නිකුතුව පිළිබඳ මුදල් කළමණාකරණය
* ප්‍රචාරක කටයුතු (කරුණු 4ට ලකුණු 2)

(v) (අ) *මහ බැංකු අධිපති *මුදල් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හා පත්කල සාමාජිකයින් තිදෙනෙකු (කරුණු 4 ට ලකුණු 2)

(ආ) *රාජ්‍ය ණය කළමණාකරණය *විදේශ විනිමය පාලනය
*කුඩා පරිමාණ මූල්‍යකරණ වැඩ සටහන් සඳහා ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම
*සේවක අර්ථ සාධක අරමුදල කළමණාකරණය (කරුණු 4ට ලකුණු 2)

04. (i) (අ) * චෙක්පත් හා අණකර හුවමාරුව හා ශුද්ධ ශේෂය ගණනය කිරීම.
* එම ශුද්ධ ශේෂ මහ බැංකුව හා අනෙකුත් වානිජ බැංකු වෙත දැනුම් දීම.
(කරුණු 2ට ලකුණු 2

(ආ) * චෙක්පත් මගින් ගෙවීම් කළ හැකි වීම. * ප්‍රේෂණ පහසුකම් ලබාගත හැකිවීම.
* නිත්‍ය නියෝග මත ගෙවීම් කළ හැකිවීම. * අයිරා පහසුකම් ලබාගත හැකිවීම.
* බැංකුව සමග කළ ගනුදෙනුවල වාර්තාවක් ලබාගත හැකිවීම (බැංකු ගිනුම් ප්‍රකාශය)
(කරුණු 4ට ලකුණු 2)

(ii) (අ) * සුරැකුම්පත් මිලට ගැනීම හා විකිණීම.
* ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම.
* ණය උපකරණ රැස් කිරීම හා ගෙවීම.
* විදුලි බිල්පත් හා ජල බිල්පත් ගෙවීම. (කරුණු 4ට ලකුණු 2)

(ආ) * චෙක්පතක මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම හෝ වානිජ බැංකුවක නමක් සඳහන් කිරීම.
* චෙක්පතට අමතර ආරක්ෂාවක් සැලසීම.
* චෙක්පතෙහි සඳහන් වටිනනාකම එහි ආදායකයාට ලැබීම සහතික කිරීම.
* බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගැනීම වැළැක්වීම. (ලකුණු 1 2/1)

(iii) (අ) * ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වාගෙන යාම.
* මුල් ක්‍රමයෙය් ස්ථායිතාව පවත්වාගෙන යාම.
(නම් කිරීමට ලකුණු 2/1 බැගින් ලකුණු 1 පැහැදිලි කිරීමට ලකුණු 1)

(ආ) ශ්‍රී ලංකාවේ බැංකු අතතර වටිනාකම් අධික ගෙවීම් කාල පමාවකින් තොරව උසස් තාක්ෂණය හා ප්‍රමිතීන් යොදාගනිමින් පියවීම සඳහා පිහිටුවා ඇති පරිගණක ගෙවුම් ක්‍රමයයි. ඉතා සුළු කාලයකින් ගෙවීම් පියවිය හැකිය.

(ලකුණු 2)

(iv) (අ) *චෙක්පතක මුහුණත සඳහන් ආකාරයටම ආදායකයා සිය නම චෙක්පතෙහි පිටුපස ලිවීමයි.
(ලකුණු 2)

(ආ) *ආදායකයා විසින් චෙක්පත බැංකුවේ තැන්පත් කිරීමේදී
* විධාන චෙක්පතක් නම් අන් අයකුට පවන අවස්ථාවේදී
* රේඛනය නොකරන ලද චෙක්පත් බැංකු කවුන්ටරයට දී මුදල් ලබා ගැනීමේදී
(කරුණු 2ට ලකුණු 2)

(v) (අ) සාමාන්‍ය රේඛණ ක්‍රම 2ක් ඇඳ පැහැදිලි කිරීමට (ලකුණු 2)

(ආ) ආදායකයාටම මුදල් ලැබෙන බව සහතික වීම. නැතහොත් චෙක්පතේ ආරක්ෂාව සලසා ගැනීම. අණලත් බැංකු කවුන්ටරයෙන් මුදල් ගෙවීම වැලැක්වීම. (ලකුණු 2)

05. (i) (අ) * ව්‍යාපාරය පාඩු
* ස්වාභාවික හේතුන් නිසා ඇතිවන අවදානම
* තම හැකියා හා ශක්තිය මත තීරණය වන අවදානම
* මෝස්තර වෙනස්වීම නිසා සිදුවන අවදානම් (කරුණු 4ට ලකුණු 2)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.


(ආ) * නෛතික බැඳීමක් ඇතිකර ගැනීමේ අදහස
* අර්පනය හෙවත් යෝජනාව
* ප්‍රතිග්‍රහනය හෙවත් පිළිගැනීම
* නෛතික බව
* ඒ ඒ පාර්ශවයන්ට නෛතික බැඳීමක් ඇතිකර ගැනිමට ඇති හැකියාව (සම්පූර්ණ පිළිතුරට ලකුණු 2)

(ii) (අ) * කැරලි කෝලාහල/ වැඩ වර්ජන හානි
* පිපිරීම් හානි
* විදුලිමය ආපදා හානි
* භූමිකම්පා/ සුනාමි
* ජලගැලීම්/සුළි සුළං/ කුණාටු වැනි
* ගුවන් යානා අනතුරු
* ගැටීම් හානි
* ආනුශංගික අලාභ හානි (සම්පූර්ණ පිළිතුරට ලකුණු 2)

(ආ) වෙනත් පාර්ශවයකට සිදුවන පාඩු පිළිබඳව ඇතිවන වගකීම රක්ෂණය කිරීමයි. (ලකුණු 1)
ඔප්පු වර්ග 2ක් සඳහන් කිරීමට (ලකුණු 1

(iii) (අ) * වෙළඳ ගනුදෙනුවලදී අදාල පාර්ශව අතර අදහස් හුවමාරු කර ගැනීම සඳහා
* සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වා ගැනීමට
* මානව හා භෞතික සම්පත් මනාව කළමණාකරණය සඳහා
* අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා (කරුණු 4ට ලකුණු 1)

(ආ)





(iv) (අ) ඛනිජ තෙල් - බවුසර්
දැව - ලොරි රථ
මාළු - ශීතාගාර සහිත ලොරි රථ
පළතුරු - ලොරි රථ (කරුණු 4ට ලකුණු 1)

(ආ) * උමං මාර්ග ප්‍රවාහනය
* ගුවන් පාලම් ඉදිකිරීම
* අධිවේගී මාර්ග ඉදිකිරීම
* විදුලි මෝටර් රථ යොදා ගැනීම
* පරිසර හිතකාමී ශක්ති ප්‍රභේද භාවිතා කිරීමට පෙළඹවීම. (කරුණු 4ට ලකුණු 1)

(v) සමබර වූ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති
නිදෘ:- නෙස්ලේ, යුනිලිවර් ආයතනය
නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා වූ ප්‍රවාහය සංකීර්ණ පද්ධති
නිදෘ:- ගුවන්යානා නිෂ්පාදන ආයතන
නිෂ්පාදනයෙන් පසු අවසන් පාරිභෝගිකයා අතට පත් කිරීම සංකීර්ණ වූ පද්ධති
නිදෘ:- රසායනික ද්‍රව්‍ය සමාගම්
නිෂ්පාදිත අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහය සහිත පද්ධති
නිදෘ:- ගෑස් සිලින්ඩර්
(නිදසුන් සහිතව කරුනු 4ට ලකුණු 1)

06. (i) (අ)




NWP EXAM


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(ආ) 1. ප්‍රති අපනයන වෙළඳාම
2. අන්තරාල වෙළඳාම

**වෙනස්කම්**

| **ප්‍රති අපනයන** | **අන්තතරාළ වෙළඳාම** |
|---|---|
| i. භාණ්ඩ රටතුළට ගෙන එයි<br>ii. තීරු ගාස්තු අය කරයි<br>iii.තීරු බදු ප්‍රතිදාන වලට හිමිකම් කියයි | i. භාණ්ඩ රට තුලට ගෙන ඒමක් සිදු නොවේ<br>i.i.තීරු ගාස්තු අය නොකෙරේ<br>iii.තීරු බදු ප්‍රතිදාන අදාල නොවේ |

(ii) (අ) ප්‍රභවස්ථාන සහතිකය
නැව්ගත කරන භණ්ඩ අපනයනය කරන රටේම නිපදවා ඇති බව සහතික කරමින් පිළිගත් ආයතනයකින් නිකුත් කරනු ලබන ලියකියවිල්ලකි.
අපනයන සටහන්කරය
තමා අපනයනය කරනු ලබන භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් කර අපනයනකරු විසින් තම රටේ රේගුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ලයි.

(ආ) ගතික පරිසරයක් තුළ ක්‍රියාත්මක වන සංවිධානයක අපේක්ෂිත පරමාර්ථ හා අරමුණු සඵලදායීව මුදුන් පමුණුවා ගැනීම සඳහා එම ආයතනය සතු සීමිත සම්පත් කාර්යක්ෂමව උපයෝජනය කිරීමේ ක්‍රියාවලියයි.

(iii) (අ) 01. තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දීමට
02. හිග සම්පත් වලින් උපරිම ප්‍රයෝජනයට ගැනීමට
03. ව්‍යාපාර පරිසර වෙනස්වීම් වලට මුහුණ දීමට
04. සංකීර්ණත්වයට සාර්ථකව මුහුණ දීම
05. ඇල්මැති පාර්ශවයන්ගේ අපේක්ෂා ඉටුකිරීමට
06. පිළිගත හැකි වෙනත්

(ආ) සැලසුම්කරණය
සංවිධානකරණය
මෙහෙයවීම
පාලනය

(iv) කාර්යක්ෂමතාව
සම්පත් නාස්තියකින් තොරව හා අවම පිරිවැයකින් යොදා ගැනීමයි. (කාර්යයන් නිවැරදිව කිරීම)
සඵලදායකත්වය
ආයතනයක අපේක්ෂිත අරමුණු සැලසුම් කළ ආකාරයට සැලසුම් කළ කාලය තුළදී ලබා ගැනීමයි (නිවැරදි දේ කිරීම)
ඵලදායකත්වය
නියමිත කාල පරිච්ඡේදයක් තුළ යම් සංවිධානයක යෙදවුම් හා නිමැවුම් අතර ඇති අනුපාතික සම්බන්ධතාවයයි.

(v) (අ) දෙන ලද කළමනාකරුවෙකුට ඍජුව වාර්තා කරනු ලබන සහයකයන්ගේ සංඛ්‍යාවයි.

(ආ) 1. කරනු ලබන කාර්යයේ ස්වාභාවය
2. ප්‍රධානියාගේ කුසලතා
3. යටත් සේවකයන්ගේ හැකියාව හා පළපුරුද්ද
4. සංවිධානයේ ප්‍රතිපත්ති

07. (i) (අ) 1. තිරස් සංවිධාන සටහන 2. සිරස් සංවිධාන සටහන
3. චක්‍රීය සංවිධාන සටහන

(ආ) අධිකාරිය යනු ව්‍යවස්ථානුකූලව ලැබෙන බලයයි. එය බලය ලැබෙන එක් මාර්ගයක් පමණි. ඒ අනුව බලය යනු අධිකාරියට වඩා පුළුල් සංකල්පයකි. බලය ලැබෙන මාර්ග කිහිපයකි.

(ii) (අ) 1. නායකත්වය


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

2. අභිප්‍රේරණය
3. සන්නිවේදනය

(ආ) ඉලක්ක ළඟාකර ගැනීමට සේවකයන් උද්දීපනය කිරීමේ ක්‍රියාවලියයි. (සේවකයන් කැමැත්තෙන් වැඩ කිරීමට පෙළඹවීමේ ක්‍රියාවලියයි)

(iii) 01. අන්තර් පුද්ගල කාර්‍යයන්
*ප්‍රධානියා ලෙස
*නායකයා ලෙස
*බාහිර සම්බන්ධතා ගොඩනගන්නා ලෙස

02. තොරතුරු කාර්‍යයන්
*නියාමකයා ලෙස
*තොරතුරු බෙදාහරින්නා ලෙස
*මාධ්‍ය ප්‍රකාශක ලෙස

03. තීරණ කාර්‍යයන්
*ව්‍යවසායකයා ලෙස
*බාධා පාලනය කරන්නා ලෙස
*සම්පත් බෙදාහරින්නා ලෙස
*කේවල් කරන්නා හා ගිවිසුම් වලට එළඹෙන්නා ලෙස

(iv) (අ) අවම යෙදවුම් ප්‍රමාණයකින් ඉහළ ගුණත්වයෙන් යුත් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමයි.

(ආ)




(v) (අ) 01. කාර්ය නිෂ්පාදනය (ඇණවුමට නිෂ්පාදනය)
02. කාණ්ඩ නිෂ්පාදනය
03. ප්‍රවාහ නිෂ්පාදනය

(ආ) 1. නිෂ්පාදිතය පිළිබඳ
2. නිෂ්පාදිතයේ විවිධත්වය පිළිබඳව
3. නිෂ්පාදන ක්‍රියාවලියේ නම්‍යශීලී බව
4. නිෂ්පාදනය කරන ප්‍රමාණය පිළිබඳව
5. නිෂ්පාදන අරමුණු පිළිබඳව (ඇණවුමකටද? වෙළඳපළට ඉදිරිපත් කිරීමටද?)

08. (i) (අ) කාර්‍යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් සකස් කිරීම සඳහා අවශ්‍ය භෞතික පහසුකම් වන කාර්‍ය මධ්‍යස්ථාන, ද්‍රව්‍ය, යන්ත්‍ර උපකරණ, සහාය සේවා ආදිය සැලසුම් කිරීම

(ආ) අමුද්‍රව්‍ය, ශ්‍රමය, බලය, උපකරණ ආදි යෙදවුම් සියල්ල නිෂ්පාදනය සිදු කරන ස්ථානයටම ගෙනෙවිත් නිෂ්පාදනය සිදු කිරීම සඳහා පිළියල කරන පිරියත ක්‍රමයයි.

(ii) (අ) සමච්ඡේදන ලක්ෂය = $\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{ඒකකයක දායකය}}$

$= \frac{20\ 000}{(10-5)} = \frac{20000}{5}$

= 4000 (ඒකක)

(ආ) 01. සමච්ඡේදන ලක්ෂය විග්‍රහය කෙටිකාලීන තීරණ ගැනීමේදී වැදගත් සාධකයක් වුවත් දිගු කාලීන තීරණ ගැනීමේදී
යොදා ගැනීම සාර්ථක නොවේ

02. සමච්ඡේදන ලක්ෂය විග්‍රහයේදී ඇති කරගනු ලබන උපකල්පන මගින් ඇති කරන සීමා
උදා:- කෙටි කාලයකදී නිෂ්පාදන හෝ විකුණුම් ඒකක ගණන අනුව ස්ථාවර පිරිවැය වෙනස් නොවුනද දිගු කාලයේදී වෙනස් විය හැකිය.


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(iii) නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව කරගෙනයාම සඳහා ප්‍රශස්ත මට්ටමින් හා අවම පිරිවැය යටතේ තොග පවත්වාගෙන යාම තොග පාලනය ලෙස හැඳින්වේ.

තොග පාලනයේ අවශ්‍යතා

*නිෂ්පාදනය හා අලෙවි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම.

*ඌන හෝ අතිරික්ත හෝ තොග පවත්වා ගැනීමෙන් සිදුවන වියදම් අවම කර ගැනීමට.

*යන්ත්‍ර සූත්‍ර හා ශ්‍රමය වැනි සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට.

*අනපේක්ෂිත ඉල්ලුම් තත්වයන්ට සාර්ථකව මුහුණ දීමට.

(iv) (අ) 1. තත්ව කව

2. තත්ව ආරක්ෂණය

3. ගුණත්ව ප්‍රමිති

4. ශූන්‍ය දෝශ

5. සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය

6. Jit ක්‍රමය

(ආ) සෑම නිෂ්පාදනයක්ම දෝෂවලින් තොරව නිෂ්පාදනය කෙරෙන බව සහතික කිරීම ශූන්‍ය දෝෂ ක්‍රමයයි. ඒ අනුව යම් වරදක් වැළැක්විය නොහැකියැයි පිළිගැනීමට වඩා ප්‍රථම වතාවටම නිවැරදි කිරීමට වග බලාගැනීම මෙයින්

අපේක්ෂා කරයි.

(v) (අ) හැඟීම් යනු

සන්නිවේදන මාධ්‍ය අතරින් තමා භාවිතා කරන සන්නිවේදන මාධ්‍ය කොතරම් විෂය පථයක් ආවරණය වනවාද

යන්න පිළිබඳ ව්‍යාපාරිකයාගේ දෘෂ්ටියයි.

නිරතවීම යනු

සන්නිවේදන මාධ්‍ය කෙරෙහි පාරිභෝගිකයා කොතරම් දුරට අවදානය යොමු කරන්නේද සක්‍රීය ලෙස සම්බන්ධ වන්නේද යන්නයි.

(ආ) 1. විකුණුම් සංකල්පය


ඩිනුදෙනුකරු සංකල්පය

3. සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය

4. අලෙවිකරණ සංකල්පය



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.


WWW.LOL.LK
BUY
PAST PAPERS
071 777 4440
Buy Online - www.LOL.lk
• GCE O/L • PAST PAPERS
• GCE A/L • SHORT NOTES

Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

0

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam



GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART



GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART



GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00



GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00



GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00